**ජනාධිපතිවරයාගේ අරමුදල - 2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජනාධිපතිවරයාගේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ලැබිය යුතු ණයගැතියෝ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට 1991 වර්ෂයේදී ලබා දී තිබුණු රු.250,000,000 ක ණය මුදලින් තව දුරටත් ලැබිය යුතු ශේෂය රු.195,000,000 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට අය විය යුතු පොලිය රු.257,406,164 කි. 2008 වර්ෂයෙන් පසු 2012 වර්ෂයේ අවසානය දක්වාත් මෙම ණය මුදල් හෝ පොලී මුදල් අයකර ගැනීමට අරමුදල අසමත් වී තිබුණි. 2013 පෙබරවාරි 28 දිනැති අංක 3/1/1/42 දරන ඉදි කිරීම් හා ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් මෙම ණය මුදල පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා ගැනීමට අපහසු බැවින් ණය මුදල කපා හැරීම සඳහා පියවර ගැනීමට ඉල්ලීම් කර තිබුණි.

(ආ) ජනාධිපතිවරයාගේ අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට වෙන්නායි අක් මුදල් ගිණුමේ ශේෂය රු.3,000,000 ක් ලෙස සඳහන් වුවද වෙන්නායි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ ශේෂ සනාථ කිරීම් අනුව එදිනට ශේෂය රු.2,910,001 ක් වුයෙන් රු.89,999 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම්වලින් රු.149,685,390 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.124,012,145 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,673,245 ක වර්ධනයක් ඇතිවීම සඳහා පොලී ආදායම හා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලැබීම් ඉහළ යාම හා ආගමික කටයුතු හා විශේෂ ව්‍යාපෘති සඳහා වූ වියදම් අඩුවීම යන කරුණු විශේෂයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබී තිබුණු රු.බිලියන1.65 ක මුදල මුළු ආදායමෙන් සියයට 88.45 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ලැබීම් වූ රු.බිලියන1.38 සමඟ සැසඳීමේදී රු.බිලියන 0.27 ක් හෙවත් සියයට 19.79 ක වැඩිවීමකි. අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීම සඳහා ඉකුත් වර්ෂයේදී රු.බිලියන 1.52 ක් වැය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 1.71 ක් වැය කර තිබුණි.

ඉකුත් වර්ෂයේ අරමුදලේ ආයෝජන රු.බිලියන 1.09 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේදී එය රු.බිලියන 1.20 ක් දක්වා වූ සියයට 10.09 ක වර්ධනයක් අත්කර ගැනීමට සමත් වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව වර්ෂ අවසාන මුදල් ශේෂය සියයට 319 කින් වැඩිවී තිබුණි. අරමුදලේ වියදම් දැරීමේදී පෙර වර්ෂයට සාපේක්ෂව සංස්කෘතික කටයුතු සහ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් දරන ලද වියදමෙහි පිළිවෙලින් සියයට 486 ක හා සියයට 410 ක වර්ධනයක් දක්නට ලැබුණද වෛද්‍යාධාර වෙනුවෙන් කරන ලද වියදමෙහි වර්ධනය සියයට 5 ක අවම මට්ටමක පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්ය සාධනය

-----------------

සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම්, සංස්කෘතික කටයුතු, ආගමික කටයුතු, සුභසාධන කටයුතු, අධ්‍යාපනික කටයුතු, දේශිය හා විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානය හා විශේෂ ව්‍යාපෘති සඳහා එකතුව රු.මිලියන 979.74 ක් වූ මුදල් වැය කර තිබුණි. එම මුළු වියදමෙන් වෛද්‍යාධාර සඳහා රු.මිලියන 857.64 ක් හෙවත් සියයට 87.53 ක් හා විදේශීය හා දේශිය ශිෂ්‍යත්ව සඳහා රු.මිලියන102.45 හෙවත් මුළු වියදමෙන් සියයට 10.45 වියදම් කර තිබුණු අතර අනෙක් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැය කර තිබුණේ මුළු වියදමෙන් සියයට 2.02 ක් හෙවත් රු.මිලියන 19.64 ක් පමණි.

සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර වශයෙන් හෘද සැත්කම් 4181 ක් සඳහා රු.මිලියන 569.40 ක්ද, පිළිකා ප්‍රතිකාර 699 ක් සඳහා රු.මිලියන 79.61 ක් ද වකුගඩු බද්ධ කිරීම් 573 ක් සඳහා රු.මිලියන 67.19 ක් ද වෙනත් ප්‍රතිකාර 756 ක් සඳහා රු.මිලියන 141.58 ක් ද වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී රෝගීන් 6265 ක් සඳහා රු.මිලියන 815.81 ක වැය කිරීම සමඟ සැසඳීමේදී රෝගීන් ප්‍රමාණය 56 ක් අඩු වී තිබුණත්, වියදම රු.මිලියන 41.83 කින් වැඩි වී තිබුණි.

අ.පො.ස (උසස් පෙළ) හදාරණ ශිෂ්‍යයන් 16,495 දෙනෙකුට ශිෂ්‍යත්ව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 98.97 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 3.23 ක් විදේශ ශිෂ්‍යත්ව 02 ක් වෙනුවෙන් වැය කර තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නිශ්චිත කාල සීමාවක් තුළ ගෙවීම් සිදුකර හිමිකම් නොපෑ ශිෂ්‍යාධාර පමාවකින් තොරව අරමුදල වෙත ආපසු ලබාගෙන නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| ලිපිගොනු අංකය | පළාත | මුදල් ගෙවූ දිනය | ඉතිරි මුදල රු. | ආපසු එවූ දිනය | ගතවූ කාලය (මාස) |
|---|---|---|---|---|---|
| Pf/school/74527 | නැගෙනහිර | 2012.07.20 | 78,000 | 2012.12.19 | 05 |
| Pf/school/74522 | වයඹ | 2012.07.23 | 96,000 | 2012.11.20 | 04 |
| Pf/school/71607 | නැගෙනහිර පළමුවන වර්ෂය | 2011.11.30 | 72,000 | 2012.03.22 | 04 |

| | | | | | |
|---|---|---|---|---|---|
| Pf/school/71605 | උතුරු මැද<br>පළමුවන වර්ෂය | 2011.11.30 | 222,000 | 2012.03.28 | 04 |
| Pf/school/71599 | බස්නාහිර<br>පළමුවන වර්ෂය | 2011.11.30 | 24,000 | 2012.04.10 | 04 |
| | දෙවන වර්ෂය | 2012.04.17 | 18,000 | 2012.10.19 | 05 |
| Pf/school/71600 | දකුණ<br>පළමුවන වර්ෂය | 2011.11.30 | 96,000 | 2012.04.23 | 04 |
| Pf/school/71603 | වයඹ<br>දෙවන වර්ෂය | 2012.03.12 | 42,000 | 2012.07.17 | 03 |
| Pf/school/71604 | සබරගමුව<br>පළමුවන වර්ෂය | 2011.11.30 | 396,000 | 2012.02.29 | 03 |
| | දෙවන වර්ෂය | 2012.03.12 | 24,000 | 2012.06.15 | 02 |
| Pf/school/71602 | ඌව පළාත<br>දෙවන වර්ෂය | 2012.03.12 | 114,000 | 2012.07.05 | 04 |

## 4. අයවැය පාලනය

අරමුදලේ අයවැය ගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 8 සිට සියයට 100 දක්වා විචලනයන් වූයෙන් වාර්ෂික අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් අරමුදලේ ලේකම් වෙත වරින්වර පෙන්වා දෙන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අරමුදල් උපයෝජනය

(ආ) ලැබිය යුතු මුදල්

(ඇ) අයවැය පාලනය

**ඇමුණුම 01**

**--------------**

**ආදායම් හා වියදම් ප්‍රකාශය**

**---------------------------------**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | |
|---|---|---|---|---|
| **ආදායම** | **2012** | | **2011** | |
| | රු. | රු. | රු. | රු. |
| දායකයන් ලැබීම | 59,758,878 | | 157,706,127 | |
| පොලී ආදායම | 155,469,134 | | 112,754,911 | |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම | 1,648,471,001 | 1,863,699,013 | 1,376,035,051 | 1,646,496,089 |
| වියදම | | | | |
| විගණන ගාස්තු | 150,000 | | 140,000 | |
| ලිපිද්‍රව්‍ය | - | | 17,625 | |
| වෛද්‍යාධාර ගෙවීම | 857,641,805 | | 815,814,246 | |
| සංස්කෘතික කටයුතු | 7,385,000 | | 1,260,000 | |
| ආගමික කටයුතු | 650,000 | | 3,150,000 | |
| සුභ සාධන කටයුතු | 611,750 | | 968,500 | |
| අධ්‍යාපන කටයුතු | 10,200,000 | | 2,000,000 | |
| ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයේ වියදම් | 102,447,038 | | 96,266,988 | |
| මහපොළ උසස් අධ්‍යාපන අරමුදලට 50% දායකය | 734,128,030 | | 600,866,585 | |
| විශේෂ ව්‍යාපෘති | 800,000 | 1,714,013,623 | 2,000,000 | 1,522,483,944 |
| වියදම ඉක්ම වූ ආදායමේ අතිරික්තය | | 149,685,390 | | 124,012,145 |

**ඇමුණුම 02**

**--------------**

**අරමුදලට අයත් මුදල් ආයෝජනය පිළිබඳ ප්‍රකාශය**

**-----------------------------------------------------------**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත සඳහන් වගුවෙන් දැක්වේ.

| ආයෝජන වර්ගය | 2012 ජනවාරි 01 දිනට ශේෂය | 2012 වර්ෂයේ ආයෝජන | 2012 වර්ෂයේ ආපසු ගැනීම් | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් | 730,888,100 | 89,716,900 | 20,000 | 820,585,000 |
| මහජන බැංකුව ස්ථාවර තැන්පත් | - | 15,000,000 | - | 15,000,000 |
| ලංකා බැංකුව ස්ථාවර තැන්පත් | - | 45,000 | - | 45,000 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජන | 2,200,000 | - | - | 2,200,000 |
| භාණ්ඩාගාර පරිපාලන ණය | 363,375,000 | - | - | 363,375,000 |
| | 1,096,463,100 | 104,761,900 | 20,000 | 1,201,205,000 |